# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
பொலிஸ் ஊடகப் பிரிவு
POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No – 10120
ෆැක්ස් / தொலைநகல / Fax – 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone – 011-2887973 (HUNTING)
වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site – www.Police.lk
ඊ මේල් / மின்னஞ்சல் / E-mail – dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO – 1584/ 2023
ඔබේ අංකය / உமது இலக்கம் / Your No – / 2023 திகதி
දිනය / Date – 16/12/2023 පැය 1900

## මාධ්‍ය නිවේදනය

**ප්‍රජා පොලිස් කමිටු සාමාජිකයින් දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම - ඇල්පිටිය, ගාල්ල, මාතර හා තංගල්ල පොලිස් කොට්ඨාස.**

දකුණු පළාත තුල ප්‍රජා පොලිස් කමිටු බලගැන්වීම සඳහා සාමාජිකයින් දැනුවත් කිරිමේ විශේෂ වැඩසටහන් කිහිපයක් 2023.12.16 වන අද දින ඇල්පිටිය පොලිස් කොට්ඨාසයේ අම්බලන්ගොඩ ධර්මාශෝක විද්‍යාලීය සමන්ත්‍රණ ශාලාවේදී, ගාල්ල පොලිස් කොට්ඨාසයේ රත්ගම මහජන ක්‍රිඩාංගණයේදී, මාතර පොලිස් කොට්ඨාසයේ රුහුණු විශ්ව විද්‍යාලයේ රබින්ද්‍රනාත් තාගෝර් අනුස්මරණ ශ්‍රවණාගාරයේදී හා තංගල්ල පොලිස් කොට්ඨාසයේ කොටුගොඩැල්ල ක්‍රීඩාංගණයේදී ගරු මහජන ආරක්ෂක අමාත්‍ය ටිරාන් අලස් මැතිතුමාගේ ප්‍රධානත්වයෙන්, අමාත්‍යාංශ ලේකම් වියානි ගුණතිලක මහතාගේ සහ වැඩ බලන පොලිස්පති දේශබන්දු තෙන්නකෝන් මහතාගේ සහභාගීත්වයෙන් පවත්වන ලදී.

මත්ද්‍රව්‍ය නිවාරණයට සහ අපරාධ අවම සමාජයක් බිහිකිරීම සඳහා සියළු ප්‍රජාවගෙන් ලැබෙන සහයෝගය තවදුරටත් සක්‍රීයව ලබා ගැනීම සඳහා ප්‍රජා පොලිස් කමිටු සාමාජිකයින් දැනුවත් කිරීම මෙම වැඩසටහන් මාලාවේ ප්‍රධාන අරමුණ විය.

2023.12.17 වන දින ආරම්භ වන විෂ මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් අත්අඩංගුවට ගැනීම සඳහා වූ වැටලීම් වෙනුවෙන් ක්‍රියාත්මක කිරීමට නියමිත **“යුක්තිය මෙහෙයුම”** සාර්ථක කරගැනීම සඳහා ප්‍රජා කමිටු සාමාජිකයින්ගේ සහය අපේක්ෂා කිරීමද මෙහි අරමුණක් වේ. කොට්ඨාස භාර නිලධාරීන්ට මේ සමඟ අමුණා එවන දුරකථන අංක වෙත මහජනතාව සතු තොරතුරු ලබාදෙන ලෙස එම අවස්ථාවේදී ජනතාව දැනුවත් කිරීමට ක්‍රියා කෙරිනි. යුක්තිය මෙහෙයුම සාර්ථක කර ගැනීම සඳහා පැය 24 පුරා ක්‍රියාත්මක පොලිස් මූලස්ථානයේ මෙහෙයුම් මැදිරිය වෙත ඕනෑම අයෙකුට තොරතුරු දැනුම්දීමේ හැකියාව ඇති බව කමිටු රැස්වීමේදී දැනුවත් කරන ලදී.

එහිදී එම කොට්ඨාසයන් හි පොලිස් ස්ථානවල පරිහරණය සඳහා අවශ්‍ය රූපවාහිණියන්ත්‍ර සංකේතාත්මකව බෙලිඅත්ත සහ මත්තල පොලිස් ස්ථාන වෙත බෙදාදීමද ගරු අමාත්‍යතුමා විසින් සිදුකරන ලදී.

මෙම අවස්ථාවට දකුණු පළාත භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති සජීව මැදවත්ත මහතා, පොලිස් විශේෂ කාර්ය බලකායේ අණදෙන නිලධාරි ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති වරුණ ජයසුන්දර මහතා සහ පුහුණු හා උසස් පුහුණු භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති නීතිඥ අසංග කරවිට මහතා ඇතුළු ජ්‍යෙෂ්ඨ නිලධාරින් පිරිසක් සහභාගී විය.

මේ සමඟ ඇල්පිටිය, ගාල්ල, මාතර හා තංගල්ල පොලිස් කොට්ඨාසවල පැවති ප්‍රජා කමිටු සැමාජිකයින් දැනුවත් කිරීමේ අවස්තාවන්ට අදාල ඡායාරූප කිහිපයක් සහ මහජනතාවට තොරතුරු ලබාදීමට හැකි දුරකථන අංක ඇතුලත් ඇමුණුමද මේ සමඟ ඔබවෙත යොමු කරමි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**